# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2152/14 - 2019 දෙසැම්බර් මස 03 වැනි අඟහරුවාදා - 2019.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වන වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර විජයපාල ශ්‍රී නාරායන වාසල බණ්ඩාරණායක මොහොට්ටලලාගේ සීතා කුමාරි අරඹේපොල වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොටගෙන වත්තල මාබෝල නගර සභාව හා වත්තල මාබෝල නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේ දී ඉහත කී නගර සභා ආඥාපනතේ 184(1) උප වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර මාස 3 ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන් විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රදාස නානායක්කාර මහත්මා පත් කරමි.

**වත්තල මාබෝල නගර සභාවට අදාළව පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා නම්,**

I. වත්තල මාබෝල නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2018.05.21 දින සිට 2019.03.05 දින දක්වා අතර කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාල සීමාවක වත්තල මාබෝල නගර සභාව සතුව තිබූ බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා විසින් සාදන ලද අංක 1377 C හා 2018 ජනවාරි 17 දිනැති පිඹුරේ කැබලි අංක $1A^2$ දරන පර්චස් 79 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයකින් යුත් ඉඩම නගර සභා ආඥාපනතේ 36 වගන්තියෙහි විධිවිධානයන්ට පටහැනිව විකිණීමට සැළැස්වීමෙන් නගර සභා ආඥාපනතේ 184(1)(ආ) වගන්තිය යටතට ගැනිය හැකි වරදක් සිදුකර තිබීම.

II. වත්තල මාබෝල නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2019.03.05 දින හෝ ඊට ආසන්න දිනකදී වත්තල මාබෝල නගර සභාව සතුව තිබූ බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා විසින් සාදන ලද අංක 1377C හා 2018 ජනවාරි 17 දිනැති පිඹුරේ කැබලි අංක $IA^2$ දරන පර්චස් 79 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයකින් යුත් ඉඩම අඩු තක්සේරු වටිනාකමක් යටතේ නියමිත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව විකිණීමට සළස්වා නගර සභා අරමුදලට පාඩු වන පරිදි ක්‍රියා කිරීමට සැළැස්වීමෙන් නගර සභා ආඥාපනතේ 184(1)(ඇ) වගන්තිය යටතට ගැනිය හැකි වරදක් සිදුකර තිබීම.

III. වත්තල මාබෝල නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2018.05.21 දින හෝ ඊට ආසන්න දිනයකදී වත්තල මාබෝල නගර සභාව සතු බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා සාදන ලද අංක 1377C හා 2018 ජනවාරි 17 දිනැති පිඹුරේ කැබලි අංක $IA^2$ දරන පර්චස් 79 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයකින් යුත් ඉඩම සීමාසහිත මෙල්කෝ ඔක්සිජන් සමාගම වෙත විකිණීමට තීරණය කිරීමෙන් නගර සභා ආඥාපනතේ 184(1)(ඉ) වගන්තිය යටතට ගැනිය හැකි වරදක් සිදුකිරීම.

1A - PG 4781 — 37 (2019/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*වත්තල මාබෝල නගර සභාවේ සභාපතිට අදාළව පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා නම්,*

I. වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2018.05.21 දින සිට 2018.07.13 දින දක්වා අතර කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාලසීමාවකදී වත්තල මාබෝල නගර සභාව සතුව තිබූ බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා විසින් සාදන ලද අංක 1377 C හා 2018 ජනවාරි 17 දිනැති පිඹුරේ කැබලි අංක $1A^2$ දරන පර්චස් 79 ක් හෝ ආසන්න ප්‍රමාණයකින් යුත් ඉඩම සීමාසහිත මෙල්කෝ ඔක්සිජන් සමාගම වෙත සින්නක්කර විකිණීමට යැයි පවසා අඩු වටිනාකමකට හේතු වන පරිදි තක්සේරු වටිනාකම ලබා ගැනීමට ක්‍රියා කිරීමෙන් නගර සභා ආඥාපනතේ 184(1) (ඉ) වගන්තිය යටතට ගැනිය හැකි වරදක් සිදුකිරීම.

II. වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2019.03.01 දින හෝ ඊට ආසන්න දිනයක දී වත්තල මාබෝල නගර සභාව සතුව තිබූ බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා විසින් සාදන ලද අංක 1377 C හා 2018 ජනවාරි මස 17 දිනැති පිඹුරේ කැබලි අංක $1A^2$ දරන පර්චස් 79 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයකින් යුතු ඉඩම කොළඹ 03, බගතලේ පාරේ අංක 28 ලිපිනයෙහි මොහොමඩ් සුබෙයිර් ෆවුසල් හක් යන අය වෙත නිසි ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමකින් තොරව විකිණීමට ක්‍රියා කිරීමෙන් නගර සභා ආඥාපනතේ 184(1)(ආ) වගන්තිය යටතට ගැනිය හැකි වරදක් සිදු කිරීම.

III. වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2019.03.01 දින හෝ ඊට ආසන්න දිනයක දී වත්තල මාබෝල නගර සභාව සතුව තිබූ බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා විසින් සාදන ලද අංක 1377 C හා 2018 ජනවාරි මස 17 දිනැති පිඹුරේ කැබලි අංක $1A^2$ දරන පර්චස් 79 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයකින් යුතු ඉඩම කොළඹ 03, බගතලේ පාරේ අංක 28 ලිපිනයෙහි මොහොමඩ් සුබෙයිර් ෆවුසල් හක් යන අය වෙත විකිණීමට කැමති බවට වූ ප්‍රතිග්‍රහණ ලිපිය වත්තල මාබෝල නගර සභාවෙහි සභා සම්මුතියකින් තොරව නිකුත් කිරීමට ක්‍රියා කිරීමෙන් නගර සභා ආඥාපනතේ 184(1)(ඉ) වගන්ති යටතට ගැනිය හැකි වරදක් සිදු කිරීම.

IV. වත්තල මාබෝල නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කරමින් 2019.02.17 දින සිට 2019.03.01 දින දක්වා අතර කාලසීමාව තුළ හෝ ඊට ආසන්න කාල සීමාවක දී වත්තල මාබෝල නගර සභාව සතු බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි මහතා සාදන ලද අංක 1377 C හා 2018 ජනවාරි මස 17 දිනැති පිඹුරේ කැබලි අංක $1A^2$ දරන ඉඩම විකිණීමට අදාළ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ 2019.02.07 දිනැති උපදෙස් හා/හෝ නියමයන් නොතකා හැර ක්‍රියා කිරීමෙන් නගර සභා ආඥාපනතේ 184(1)(ඇ) වගන්තිය යටතට ගැනිය හැකි වරදක් සිදු කර ඇත.

තවද 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥා පනතේ 184(1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස් වරයෙකු සතු බලතල මෙම ඒක පුද්ගල පරීක්ෂණ සභාව වෙත හිමිවන අතර, ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේදී අදාළ කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උප ලේඛණයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

විජයපාල ශ්‍රී නාරායන වාසල බණ්ඩාරණායක,
මොහොට්ටලලාගේ සීතා කුමාරි අරඹේපොල,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2019 දෙසැම්බර් මස 02 වන දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 204 හි පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

උපලේඛණ

ඉහත චෝදනා සනාථ කිරීම සඳහා උපයෝගී කර ගත යුතු ලිඛිත සාක්ෂි.

I. කේ. ප්‍රේමනාත් කලෙහෙවත්ත, නීතිඥ හා නොතාරිස් තැනගේ අංක 63 දරන 2000 ජුනි 08 දිනැති බදු ගිවිසුමේ සහතික කළ පිටපත.

II. 2018.05.21 වන දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපත

III. 2019.03.01 දින ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපත.

IV. 2019.03.01 දින ලංසු විවෘත කිරීමේ රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපත.

V. පිඹුරු අංක 1377 C ලොට් අංක $1A^2$ ඉඩම සඳහා රජයේ තක්සේරුව ලබා ගැනීමේ මැයෙන් ප්‍රධාන තක්සේරුකරු ඇමතු වත්තල මාබෝල නගර සභාවේ සභාපතිගේ දින හා අංක රහිත ලිපියේ සහතික කළ පිටපත.

VI. ගම්පහ දිස්ත්‍රික් තක්සේරු කරුගේ අංක GM/LM/5630 හා 2018.07.13 දිනැති වත්තල මාබෝල නගර සභාවේ සභාපති ඇමතු ලිපියේ සහතික කළ පිටපත.

VII. ගම්පහ ප්‍රාදේශීය තක්සේරුකරුගේ අංක GM/LM/5630 හා 2018.12.21 දිනැති වත්තල මාබෝල නගර සභාවේ සභාපති ඇමතූ ලිපියේ සහතික කළ පිටපත.

VIII. ඩී. ඒ. වීරක්කොඩි බලයලත් මිනින්දෝරු තැනගේ අංක 1377C දරන පිඹුරේ සහතික කළ පිටපත.

IX. බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජයන්ත පෙරේරා මහතාගේ පිඹුරු අංක 1131 පිඹුරේ සහතික කළ පිටපත.

X. වත්තල මාබෝල නගර සභාවට අයත් අස්වද්දුම ඉඩම විකිණීම සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් පළාත් පාලන කොමසාරිස් මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇමතූ අංක F/172/4 හා 2019.01.14 දිනැති වත්තල මාබෝල නගර සභාවේ සභාපතිගේ ලිපිය හා එකී ලිපියේ සඳහන් ලේඛන වල සහතික කළ පිටපත්.

XI. බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අංක CM/WP/E16/1/4/2016 ගම්පහ (11 වෙළුම) හා 2019.02.07 දිනැති පළාත් පාලන කොමසාරිස් ඇමතූ ලිපියේ සහතික කළ පිටපත.

XII. වත්තල මාබෝල නගර සභාවේ යොමු අංක : 132443 දරන 2019.03.05 දිනැති න.ස. 3 දරන ලදුපතේ සහතික කළ පිටපත හා ලංකා බැංකුවේ අංක 134748 ගිණුමට 2019.03.05 චෙක්පත් තැන්පතු රිසිට් පතේ සහතික කළ පිටපත.

XIII. මොහොමඩ් සුබෙයිර් ෆවුසල් හක් මයා ඇමතූ 2019.03.01 දිනැති වත්තල මාබෝල නගර සභාවේ සභාපතිගේ ලිපියේ සහතික කළ පිටපත.

XIV. මොහොමඩ් සුබෙයිර් ෆවුසල් හක් මයා ඇමතූ 2019.03.05 දිනැති වත්තල මාබෝල නගර සභාවේ සභාපතිගේ ලිපියේ සහතික කළ පිටපත.

XV. ටෙන්ඩර් දැන්වීම් පළ කර ඇති 2019 පෙබරවාරි 15 දින තිනකරන් සහ ඩේලි නිවුස් පුවත්පත් වල සහතික කළ පිටපත.

XVI. 2019 පෙබරවාරි 14 දිනමිණ පුවත්පත් ටෙන්ඩර් දැන්වීමේ සහතික කළ පිටපත.

XVII. මොහොමඩ් නලීම් මොහොමඩ් උෂාන් නො. 454/21 පාසැල් පටුමග, උලහිටිවල මල්වාන ලිපිනයෙහි 2019.02.25 දිනෙන් ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් පෝරමයේ සහතික කළ පිටපත.

XVIII. මොහොමඩ් සුබෙයිර් ෆවුසල් හක් මයා නො. 28, බගතලේ පාර, කොළඹ - 03 ලිපිනයෙන් 2019.02.22 දිනෙන් ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් පෝරමයේ සහතික කළ පිටපත.

XIX. මොල්බන් රෝලින් මිල් පුද්ගලික සමාගම, නො. 411, මීගමු පාර, වත්තල ලිපිනයෙහි ඉදිරිපත් කර ඇති දින රහිත ටෙන්ඩර් පෝරමයේ සහතික කළ පිටපත.

XX. නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ජේ. පී. එම්. එස්. මධුවන්තිකා මියගේ අංක 15 දරන බදු ගිවිසුම අවලංගු කිරීමේ ඔප්පුවේ සහතික කළ පිටපත.

XXI. නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. තුෂාර ප්‍රියංකර මහතාගේ අංක 917, දරන විකුණුම්කරයේ සහතික කළ පිටපත.

XXII. ප්‍රසිද්ධ නොතාරිස් ජොශප් ආතර් පල්ලේගම මහතාගේ 1973 දෙසැම්බර් 11 දිනැති අංක 2277 දරන විකුණුම්කරයේ සහතික කළ පිටපත.

ඉහත චෝදනා සනාථ කිරීම සඳහා උපයෝගී කර ගත යුතු වාචික සාක්ෂි.

| | | |
|---|---|---|
| I. | පළාත් පාලන ලේකම් (බ.ප) හෝ ඔහු විසින් බලය පවරනු ලබන අයෙකු. | පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත. |
| II. | පළාත් පාලන කොමසාරිස් (බ.ප) හෝ ඔහු විසින් බලය පවරනු ලබන අයෙකු. | පළාත් පාලන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත. |
| III. | පළාත් පාලන සහකාර කොමසාරිස්, ගම්පහ දිස්ත්‍රික්කය | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගම්පහ දිස්ත්‍රික්කය. |
| IV. | එස්. එම්. ප්‍රසන්න ආරියතිලක මයා | ප්‍රාදේශීය තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව, බටහිර උතුර කාර්යාලය, ගම්පහ. |
| V. | දේවිකා ප්‍රියන්ති හේරත් සමරවික්‍රම මිය | හිටපු ලේකම්, වත්තල මාබෝල නගර සභාව. |
| VI. | ගීතානි ලොකුවැල්ල මිය | ලේකම්, වත්තල මාබෝල නගර සභාව. |
| VII. | ඩී. ඒ. වීරක්කොඩි මයා | බලයලත් මිනින්දෝරු 17/4 විජය මාවත, නාවල පාර, නුගේගොඩ. |

| | | |
|---|---|---|
| VIII. | ඒ. ඒ. පී. ජයන්ත පෙරේරා මයා | බලයලත් මිනින්දෝරු 218 මාකෙවිට පාර, ජා ඇල. |
| IX. | දේවිගා රාණි චන්ද්‍ර මෝහන් මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර, වත්තල මාබෝල නගර සභාව |
| X. | කැකුළාවල ජයවර්ධනලාගේ ජීවා සමන්ති රණසිංහ මිය | අභ්‍යන්තර විගණන නිලධාරී, වත්තල මාබෝල නගර සභාව. |
| XI. | මුත්තු රාගිනි මිය | කළමනාකරණ සහකාර, වත්තල මාබෝල නගර සභාව. |
| XII. | බාලසූරිය ලේකම්ලාගේ භාග්‍යා උමයාංගනී මිය | තාක්ෂණ නිලධාරී, වත්තල මාබෝල නගර සභාව. |
| XIII. | නිලාබ්දීන් රිශ්මිනා මිය | සෞඛ්‍ය කම්කරු, වත්තල මාබෝල නගර සභාව. |
| XIV. | වෙඩිසිංහ ආරච්චිගේ රවීන්ද්‍ර චානක ඉන්ද්‍රජිත් මයා | ආදායම් පරීක්ෂක, වත්තල මාබෝල නගර සභාව. |
| XV. | හෙට්ටිආරච්චිලාගේ මංගල ප්‍රේමකුමාර මයා | කළමනාකරණ සහකාර, වත්තල මාබෝල නගර සභාව. |
| XVI. | සඳුනි තරුෂිකා සිල්වා මිය | කළමනාකරණ සහකාර, වත්තල මාබෝල නගර සභාව. |
| XVII. | මොහොමඩ් සුබෙයල් ෆවුසල් හක් මයා | අංක 28, බගතලේ පාර, කොළඹ 03. |
| XVIII. | මොහොමඩ් සිද්ධික් මොහොමඩ් නජබුදීන් මයා | අධ්‍යක්ෂක, මෙල්කො ඔක්සිජන් (පුද්ගලික) සමාගම, නො. 411, මීගමුව පාර, වත්තල. |
| XIX. | එම්. ජී. ජී. ජේ. පින්තු මයා | පළාත් පාලන සහකාර කොමසාරිස් (විමර්ශන) වැ.බ., පළාත් පාලන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත. |
| XX. | ඩබ්ලිව්. පද්මසිරි මයා | විමර්ශන නිලධාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත. |

12 - 560

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.